---

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2013 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 අගොස්තු 24 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 07 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, ආණමඩුව ප්‍රාදේශීය සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.55,322,023ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,818,402ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,104,806ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය විය.

**(අ)** ගිණුම් විෂයන් 07කට අදාළ ශේෂයන්ගේ එකතුව රු.16,601,057ක් වූ අතර, එම විෂයයන්ට අදාළව පවත්වා තිබූ ලේඛනවලට අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.4,968,061ක් වූයෙන් රු.11,632,996ක වෙනසක් ගිණුම්වල දක්නට ලැබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට සභාව විසින් ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.7,818,245ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.2,956,016 ක් විය.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.4,675,877ක් විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු එකක කාලයක් ඉක්මවා අවලව පවතින වත්කම්වල වටිනාකම රු.78,597ක් විය.

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 1,797 | 861 | 936 |
| (ii) | බදු කුලී | 7,690 | 5,088 | 2,602 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 950 | 747 | 203 |

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු සියළුම උසාවි දඩ හා මුද්දර ගාස්තු විධිමත් පරිදි ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

වටිනාකම ඇස්තමේන්තු කර නොමැති අංක 49-1965 දරණ මිනි කුබෝටා රෝද හතරේ ට්‍රැක්ටරය වසර 04ක් ද, බ්ලොක් ගල් යන්ත්‍රය වසරක කාලයක් ද, වටිනාකම රු.597,668ක් වූ අංක 49 – 0994 දරණ ට්‍රැක්ටරය වසර 02 කාලයක් ද නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

**2.5 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වාහන පාලනය
(ඈ) ගබඩා පාලනය